(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 390.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 සැප්තැම්බර් මස 10 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3244 /'12

1.

ගරු රවි කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3710/'13

2.

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාගේ නිල කාර්ය මණ්ඩලය සඳහා අනුමත නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) වත්මන් ජනාධිපතිවරයාගේ නිල කාර්ය මණ්ඩලයේ සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) එම කාර්ය මණ්ඩලයට අයත් එක් එක් තනතුර හා ඊට අදාළ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම තනතුරු දරන එක් එක් අයගේ නම, අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම කාර්ය මණ්ඩලය වෙනුවෙන් ගෙවනු ලබන වැටුප සහ අනෙකුත් සියලු පහසුකම් හා දීමනාවන් කවරේද;

(vi) ඒ අනුව ජනාධිපති කාර්ය මණ්ඩලය වෙනුවෙන් පසුගිය වර්ෂ 3 තුළ දැරූ පිරිවැය කොපමණද;

(vii) එම පිරිවැයට සාපේක්ෂව ඉහත කාර්ය මණ්ඩලය සෑහීමකට පත්විය හැකි අන්දමේ ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3829/'13

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කන්තලේ වන රක්ෂිතය සහ නාවික හමුදා වැඩබිම පිහිටි අභයභූමිය තුළ අනවසර හා නීති විරෝධී ගල්කොරි 30ක් පමණ පවත්වාගෙන යනු ලබන බවත්;

(ii) දැනට තාවකාලිකව නවතා දමා ඇති තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, ගල්මැටියාව ග්‍රාම නිලධාරී වසමේ, කන්තලේ වන රක්ෂිතය තුළ පිහිටි මහා පරිමාණ ගල්කොරිය නැවතත් ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බවත්;

(iii) ඒ සඳහා අවසර ලබාදෙන ලෙසට ප්‍රදේශයේ ප්‍රබල දේශපාලනඥවරියක් රජයේ නිලධාරීන්ට දැඩි බලපෑම් කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත උල්ලංඝනය කරමින් වනාන්තර එළිපෙහෙළි කර ගල්කොරි පවත්වාගෙන යාම නීති විරෝධී ක්‍රියාවක් මෙන්ම පරිසරයට දැඩි හානි ගෙනදෙන ක්‍රියාවක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, මෙම නීති විරෝධී ක්‍රියාවන් නවතාලීම සඳහා කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4104/'13

4.

ගරු රෝසි සේනානායක මහත්මිය,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉහළ ජෛව විවිධත්වයක් සහිත සංරක්ෂිත වනාන්තරයක් වන පිදුරුතලාගල කඳු වැටියේ බටහිර බෑවුමේ අර්තාපල් වගාව හා එළවළු වගාව වෙනුවෙන් විශාල භූමි ප්‍රමාණයක් එළිපෙහෙළි කර තිබේද;

(ii) එසේ නම්, එම එළිපෙහෙළි කිරීම සිදුකළ පාර්ශ්වයන් කවුරුන්ද;

(iii) ඔවුන්ට මේ සඳහා අවසර ලබා දුන් අය කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4443/'13

5.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ නව නිවාස ඉදිකර දීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ හඳුනාගෙන තිබූ නිවාස නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් වෙනුවෙන් නිවාස ඉදිකිරීම සඳහා රජය මගින් ලබා දීමට අපේක්ෂා කළ ප්‍රතිපාදන කවරේද;

(iii) එකී ප්‍රතිපාදන මත සිදුකළ නිවාස ඉදිකිරීම් කටයුතු 2014 දැයට කිරුළ ප්‍රදර්ශනය ආරම්භ කිරීමට පෙර නිමකර ජනතා අයිතියට පත් කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4558/'13

6.

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) නිවසක හිමිකමක් නැති, අඩු ආදායම්ලාභී, විදේශගත ශ්‍රමිකයින් සඳහා "රටවිරුවෝ ණය වැඩසටහන" නමින් නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස ණය වැඩසටහන ක්‍රියාත්මක කළ දිනය කවරේද;

(ii) එම ණය ලබාදීම සිදු කරනු ලබන බැංකු කවරේද;

(iii) එම එක් එක් බැංකුවේ මෙරට ක්‍රියාත්මකව පවතින ශාඛා සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම ණය ව්‍යාපෘතිය පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමට සහ ඊට අදාළව සිදුකර ඇති අනෙකුත් පරිපාලන කටයුතු වෙනුවෙන් දරන ලද වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත වැඩසටහන යටතේ ණය මුදලක් ලබා ගැනීම සඳහා අදාළ වන කොන්දේසි සහ සුදුසුකම් කවරේද;

(ii) එක් අයකුට ලබා දෙන උපරිම ණය මුදල කොපමණද;

(iii) එම ණය මුදල වෙනුවෙන් අය කරනු ලබන පොලී අනුපාතය කොපමණද;

(iv) මේ වන විට එම ණය මුදල ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව සහ ණය ලබා දී ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4569/'13

7.

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— අධ්‍යාපන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) හුදකලා පාසල් යනුවෙන් හඳුන්වනු ලබන පාසල් එසේ වර්ගීකරණය කිරීම සඳහා පදනම් කරගත් නිර්ණායක කවරේද;

(ii) දැනට පවතින හුදකලා පාසල් සංඛ්‍යාව සහ එම පාසල්වල අධ්‍යාපනය ලබන සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2013 වර්ෂයේ අයවැය යෝජනාවන්ට ඇතුළත්වූ ඉහත සඳහන් පාසල් සිසුන්ට වසර මැද දී අතිරේක නිල ඇඳුම් රෙදි කට්ටලයක්, නොමිලේ පාවහන් යුගලක් සහ ධාන්‍ය, බිත්තර සහ කිරි සහිත ආහාර වේලක් ලබාදෙන බවට වූ යෝජනා අනුව එම එක් එක් පහසුකම ලැබූ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒ සඳහා වාර්ෂිකව රජය වැය කරන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4712/'14

8.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) මුරුන්කන් පොලිස් වසමට අයත්, මලුවරායර්, කට්ටෙයි, අඩම්පන්, මඩුපාර, මුරුක්කන් ලිපිනයේ පදිංචිව සිටි මාරිමුත්තු ෂන්මුගම් මහත්මිය සහ ඇයගේ පවුලේ සාමාජිකයන් එල්.ටී.ටී.ඊ. තර්ජන හමුවේ එම නිවස හැර ගොස් සරණාගතයින් ලෙස වෙනත් ප්‍රදේශයක ජීවත් වූ කාල සීමාව තුළ දී ඔවුන්ගේ නිවස පිහිටි ස්ථානයේ අධි බලැති විදුලි රැහැන් යෙදීම සඳහා වූ මහා පරිමාණයේ විදුලි කුළුණක් ඉදිකරනු ලැබ ඇති බවත්;

(ii) ඔවුන්ගේ නිවස ඉවත් කොට එම ස්ථානයේ විදුලි කුළුණක් ඉදිකිරීම වෙනුවෙන් මාරිමුත්තු ෂන්මුගම් මහත්මියට වන්දි මුදල් ලබා දීම නිර්දේශ කරමින්, ලංකා විදුලිබල මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් අංක DGM (P&HM-R1) GEN හා 2011.07.07 දිනැති ලිපිය මගින් වව්නියාවේ ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන ඉංජිනේරු වෙත ලිඛිතව දැනුම් දී ඇති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) පදිංචි නිවස අහිමි වී අසරණභාවයට පත්ව සිටින ෂන්මුගම් මහත්මියට ලබාදිය යුතු වන්දි මුදල් මෙතෙක් ලබා නොදීමට හේතු කවරේද;

(ii) එම වන්දි මුදල් නොපමාව ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4744/'14

9.

ගරු අශෝක් අබේසිංහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ තිබෙන විදුලිය නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) විදුලි දිගු මගින් විදුලි සැපයුම ලබාදීමට ඇති ස්ථාන සඳහා විදුලි දිගු ලබාදීමට කටයුතු කරන්නේද;

(iii) අඩු විදුලි ධාරිතාවක් ඇති නගරවල විදුලි ධාරිතාව වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4815/'14

10.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අස්ථානගත වූ වාහන ආදායම් බලපත්‍රයක් වෙනුවෙන් පිටපතක් ලබා ගැනීමේදී එම බලපත්‍රය නැති වූ දින සිට ඉදිරි කාලය වෙනුවෙන් සම්පූර්ණ බලපත්‍ර ගාස්තුවම නැවත බලපත්‍ර හිමියාගෙන් අය කර ගන්නා බව එතුමා දන්නෙහිද?

(ආ) අදාළ වර්ෂය වෙනුවෙන් ආදායම් බලපත්‍රය සඳහා ගාස්තු ගෙවා රජයේ ආදායමට බැර කර තිබියදී, එකී බලපත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා නැවත සම්පූර්ණ බලපත්‍ර ගාස්තුවම අය කිරීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) සාමාන්‍ය කඩදාසියක මුද්‍රිත වාහන ආදායම් බලපත්‍රය විනාශ වීමට හෝ අස්ථානගත වීමට වැඩි හැකියාවක් ඇති බව පිළිගන්නේද;

(ii) එබැවින්, එම බලපත්‍රයේ පිටපතක් ලබා ගැනීමේදී ඒ සඳහා වැය වන පිරිවැය පමණක් අය කර එය නිකුත් කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4847/'14

11.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ සූදු ව්‍යාපාරය කරගෙන යාම සඳහා මේ දක්වා නිකුත් කර ඇති බලපත්‍ර ප්‍රමාණය කොපමණද;

(ii) එවන් බලපත්‍ර ලබාගෙන ඇති පුද්ගලයන්ගේ සහ / හෝ සමාගම්වල නම් කවරේද;

(iii) එම එක් එක් බලපත්‍රය නිකුත් කරන ලද දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

4920/'14

12.

ගරු තිස්ස අත්තනායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006.02.28 දින රංගිරි දඹුලු ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ ස්ථිර සේවයට බඳවා ගත් කම්කරුවන් පිරිසක් 2011.12.31 දින සේවයෙන් ඉවත් කරන ලද බවත්;

(ii) ඔවුන්ට රු.250,000.00 ක වන්දි මුදලක් ලබා දී ඇති බවත්;

(iii) එම ක්‍රීඩාංගණයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී එම සේවකයන්ට ප්‍රමුඛතාවය ලබා දෙන බවට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් අධිකරණය හමුවේ පොරොන්දුවක් ලබා දුන් බවත්;

(iv) එසේ වුවද, ඔවුන් නොසලකා හැර සිවිල් ආරක්ෂක බලකායේ 24 දෙනෙකු එම ක්‍රීඩාංගණයේ සේවයට බඳවා ගෙන ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත (අ) (i) හි සඳහන් කම්කරුවන්ගේ නම් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) එම ක්‍රීඩාංගණයේ සේවයේ නියුතු මුළු සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) සේවයෙන් ඉවත් කරන ලද සේවකයින්ට ගෙවන ලද මාසික වැටුප කොපමණද;

(iii) ඔවුන් සේවයෙන් ඉවත් කිරීමට බල පෑ හේතු කවරේද;

(iv) ඉහත (අ) (iv) හි සඳහන් පිරිස බඳවා ගැනීම සඳහා විශේෂ සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ දිනය කවරේද;

(v) නැවත බඳවා ගැනීමේදී ඉවත් කළ පිරිස වෙනුවෙන් ප්‍රමුඛතාවය ලබා නොදීම නිසා ඔවුන් දැඩි අසාධාරණයකට ලක් වූ බව පිළිගන්නේද;

(vi) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4948/'14

13.

ගරු සුජීව සේනසිංහ මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාඩුව මේ වන විට රුපියල් බිලියන 95 ඉක්මවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ බැංකු අයිරා වෙනුවෙන් පමණක් රුපියල් කෝටි 43කට අධික මුදලක් ගෙවීමට තිබේද;

(ii) මේ වන විට රාජ්‍ය බැංකු විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ණය ලබා දීම ප්‍රතික්ෂේප කර තිබේද;

(iii) එසේ නම්, එම තත්ත්වය යටතේ ඉහළ ණය පොලී කොන්දේසි මත විදේශීය තෙල් සමාගම්වලින් ඉන්ධන ලබා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5192/'14

14.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලාංකික හා ඉන්දියානු ධීවරයන්ගේ ගැටලු සම්බන්ධයෙන් මෑතකදී පැවති සාකච්ඡාවල ප්‍රගතිය කවරේද;

(ii) එම ධීවර ගැටලුව සම්බන්ධයෙන් රජයේ මැදිහත්වීම කවරේද;

(iii) මේ වන විට ඉන්දියාවේ අන්ද්‍රා ප්‍රදේශයේ රඳවාගෙන සිටින ශ්‍රී ලාංකික ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන් මුදා ගැනීමට රජය විසින් කර ඇති මැදිහත්වීම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ධීවරයින්ට ලබා දුන් ඉන්ධන සහනාධාරය නවතා තිබේ නම්, ඒ වෙනුවට හඳුන්වා දෙනු ලැබූ විකල්ප පැකේජයක් තිබේද;

(ii) එසේ නම්, එය කවරේද;

(iii) එම සහනාධාර පැකේජය සහ ඉන්ධන සහනාධාර ක්‍රමය අතර වෙනස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1\.

අධිකරණ අමාත්‍යතුමා,— අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ,— අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් දැක්වීම සහ එම අයිතිවාසිකම් සහ හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිණිස ද; වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට අදාළ සුදුසු ජාත්‍යන්තර ප්‍රතිමාන, ප්‍රමිති සහ යහපත් ප්‍රතිපත්ති බලාත්මක කිරීම පිණිස ද; අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ජාතික අධිකාරියක් පිහිටුවීම; කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය; ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාස පිහිටුවීම පිණිස ද; අපරාධයක වින්දිතයන්ට වන්දි ගෙවීම; අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම පිණිස ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

2\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 2 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

3\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග අංක 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතුය. අ. භා. 4.00 ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

4\.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2014 සැප්තැම්බර් මස 23 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2014 සැප්තැම්බර් 09),— "1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජුලි 21 දිනැති අංක 1872/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.08.19 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය."

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*2.

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය,— සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විමසා සාදන ලදුව, 2014 ජුනි මස 16 දිනැති අංක 1867/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.09.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2014 අගෝස්තු මස 07) [1]

*5.

මහනගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

නගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති

යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*15.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන

අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*18.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,—2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 34 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 මැයි 19 දිනැති අංක 1863/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.08.19 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*20.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*21.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*22.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2014.01.21 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද

විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.04.24 දින සලකා බලන ලදී.)

*23.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*24.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*25.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*26.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*27.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද

විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*28.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2011,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*29.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව - 2011,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරිය පනතේ 34(2) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*30.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*31.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව - 2011,— 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 27 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*32.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ

2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

33.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

34.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

35.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

36.

අල් ජමියාතුල් ත්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

37.

ජයන්තිපුර සුහසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

38.

මෙත් සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

39.

ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

40.

ජයරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

41.

ජම් ඉය්යතුස් සහ්වා අල් - හයිරිය්යා (ජස්කා) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

42.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

43.

අනුර විදානගමගේ ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

44.

අල්හසන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

4559/'13

1.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1989 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාල සීමාව තුළ මරණ දඬුවම නියම වූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කාල සීමාව තුළ මරණ දඬුවම නියම වූ එක් එක් පුද්ගලයින්ගේ නම, ලිපිනය, දඬුවම් නියම කරන ලද අධිකරණය, දඬුවම් නියම වූ දිනය සහ නඩු අංකය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මරණ දඬුවම් ලැබූ ඉහත සඳහන් අය අතරින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට පැවරුණු බලතල අනුව එම දඬුවම ජීවිතාන්තය දක්වා සිර දඬුවමක් බවට පරිවර්තනය කරනු ලැබූ අයගේ නම්, ලිපිනයන් සහ ඊට අදාළ දිනයන් කවරේද;

(ii) වර්ෂ 1989 සිට 2005 දක්වා සහ 2012.06.01 සිට මේ දක්වා කාල සීමාවන් තුළදී ජනාධිපති සමාව යටතේ නිදහස් කරනු ලැබූ අයගේ නම්, ලිපිනයන් සහ නිදහස ලැබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?